# මහ වන මැද හල්මිල්ලෑව සෙනසුන

**කොරතොට විජේතුංග**



වැසී ගිය ගල් ලෙන පාදන අයුරු.



ප්‍රධාන ලෙන් විහාරය හා එහි යෑමට සකසා ඇති පැරැණි පියගැට පෙළ

යෝගාවචර භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් අදත් හුදෙකලාව බුදුහිමි දෙසා වදාළ නිවන් මඟ අවබෝධ කරගනු සඳහා වනගතවී භාවනානුයෝගීව වැඩ වෙසෙති. මරදන්කඩවල නගරයට ඔබ්බෙන් වූ අලි - කොටි - වග වලසුන් ගෙන් ගහන මහා වනය මැඳ පිහිටි හල්මිල්ලෑව ගම්මානයේ චන්ද්‍රසාර ගුහාව වන සෙනසුන ද එබන්දකි.

තලාව - කැකිරාව මාර්ගයේ තලාව සිට කැකිරාව දෙසට කිලෝමීටර් 10 ක් පමණ දුර ගමන් කළවිට පුංචි කුලම කඩමණ්ඩිය හමුවෙයි. එය උතුරු මැද පළාතේ නොදියුණු කුඩා නගරයකි. කඩමණ්ඩියෙන් දකුණු දෙසට හැරුනු තැන් සිට මහ වනාන්තරය මැදින් දිවෙන මාර්ගය තරමක් දුෂ්කරය. අලියා ළඟ ළඟම ඇති බවට දැනෙන චකිතය සිතට බිය උපදවයි. රුස්ස ගහ කොළ වටකරගත් වන රුප්පාවෙන් නැගෙන කුරුලු ගී රාවය කනට මිහිරක් ගෙන ඒමට සමත් වුවද, මෙම ප්‍රදේශයේ නිතර නිතර සිදුවන බව කියන අලි - මිනිස් ගැටුම් පිළිබඳව මතකයට නැගෙන විට හදවත බියෙන් වෙලෙයි. වනපෙත සරුසාර කරමින් වන සීපාවුන්ට පැන් පහසුව සැලසූ දිය කඩිති තද ඉඩෝරය නිසා වියැලී ගොස්ය. පිවිසුම් දෙරටුව අසලට ළඟා වනවිට මුලින්ම අප ඇස ගැසුනේ ට්‍රැක්ටරයක් ඈඳගත් විශාල ජල බවුසරයකි. සේනපුර හමුද කඳවුරේ සිට එහි ලඟාවී තිබුණු එම බවුසරයෙන් හමුද හට පිරිසක් සෙනසුනේ කඳු ගැටයේ ගල්ලෙන අසල වූ ජල ටැංකියට ජලය පොම්ප කරමින් සිටියහ. සේනපුර හමුද කඳවුරේ ප්‍රධාන අණදෙන නිළධාරි තැනගේ කාරුණික අවධානය නිසා වන සෙනසුනට ඒ අන්දමින් ජලය සැපයීමක් නොවන්නේ නම් නියං සමයට සෙනසුනට ජලය සපයා ගත හැකි වන වෙනත් මගක් නැත.

පඬු පැහැගැන් වූ සිවුරෙන් කය වසාගත් තරුණ හිමි නමක් ඔවුන් කෙරේ පින් සිතින් ඒ අසළ රැඳී සිටියහ. ඒ ආරණ්‍යවාසී කන්තලේ විමලසිරි හිමියෝය.



වන අරණේ හිමිවරුන්.

හමුද හටයින්ට අත් උදව් දෙමින් එහි සිටි ගැමියන් කීප දෙනා අතර වූ යූ.බී. ඉලංගසිංහ මහතා විශ්‍රාම ලත් ගුරු භවතෙකු මෙන්ම මෙම වන සෙනසුනේ උන්නතිය සඳහා ඇප කැප වෙමින් නිතර දෙව්ලේ එහිම රැඳී කටයුතු කරන වැඩිහිටි ගැමියෙකි. ඔහු දයක සභාවේ අනුශාසක වරයෙක් ද වෙයි.

වයෝවෘද්ධ පුද්ගලයෙකු වූ ඔහුට ප්‍රදේශයේ ඓතිහාසික තොරතුරු පිළිබඳව ඇත්තේ මනා අවබෝධයකි. \ඉලංගසිංහ මහතා පවසන අන්දමට චන්ද්‍රසාර ගුහාව නමින් හැඳින්වෙන මහා ගල්ලෙන ආශ්‍රිත මෙම වන පියස තුළ සැඟවී ඇත්තේ ඓතිහාසික වටිනාකමකි. සුවිසල් ලෙන් විහාරය සහිත කඳු ගැටය ඉස්මත්තේ ඇති බ්‍රාහ්මී අක්ෂරවලින් යුත් ලෙන් ලිපිය රාජ රාජ මහාමාත්‍යාදීන් මෙම වන සෙනසුන සමඟ පැවැත් වූ සම්බන්ධකම් සනාථ කරවයි. එහෙත් ගැමියන්ගේ මුඛ පරම්පරාගත කතා බහ හැරුනුවිට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් එබඳු කිසිම රජයේ වගකිවයුත්තෙකුගේ අවධානයක් මෙතෙක් මෙම අගනා පුදබිම් පිළිබඳව යොමු වී නොමැත.

එක පැත්තකින් ඓතිහාසික රිටිගල කන්දටත් අනෙක් පැත්තෙන් හත්ථිකුච්ඡි විහාරයටත් මැඳි වී පිහිටි මෙම පුදබිම රාමඤ්ඤ නිකාය මෙරට ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබීමෙන් පසු එම නිකායේ ධර්ම ප්‍රචාරක මධ්‍යස්ථානයක් ලෙස පැවති බව කියැවේ.

වැලිවිට අසරණ සරණ පිණ්ඩපාතික සරණංකර සඟ නා හිමියන් සියම් දේශයට වැඩම කොට පෙරළා සියරට පැමිණ මෙරට සියම් නිකාය පිහිටුවීමත් සමගම බුලත්කුළමේ සරණංකර නමැති නා හිමි නමක් රාමඤ්ඤ නිකාය මෙරට පිහිටුවා එහි මූලස්ථානය ලෙස මෙම පුදබිම පවත්වාගෙන යමින් මෙම පින්බිමේ සිට දහම් සුවඳ විහිඳුවා ලූ බව පැවසේ. එකල රහතුන් වහන්සේලා වැඩසිටි බව සැලකෙන ගල්ලෙන් රාශියක් මෙම කඳු ගැටය ආශ්‍රිතව වනමැද වල් බිහිවෙමින් තිබෙන අයුරු දැක ගත හැකි අතර, මෙම බිම් පෙදෙසේ සැඟවී ඇති බෞද්ධාගමික අගය තේරුම් ගත් ගම් වැසියෝ කැති, උදළු, අලවංගු ආදිය අතැතිව පැමිණ කණ්ඩායම් වශයෙන් සැදී කැලෑව එළිපෙහෙළි කරමින් හා පස්කඳු ඉවත් කරමින් මෙම ගල්ලෙන් පෑදීමෙහි යෙදී සිටිති. වන මැද ලිප් බැඳගත් තවත් ගැමියන් පිරිසක් ඔවුන්ට බත සපයති. දැනටමත් කැලෑවෙන් වැසීගොස් තිබුණ ලෙන් 20 ක් පමණ පාද ගැනීම සඳහා හඳුනාගෙන ඇතැයි ඉලංගසිංහ මහතා පැවසීය. කඳු බෑවුමේ ඇති කුඩා සංඝාවාසය තුළ දක්නට ලැබෙන අංග සම්පූර්ණ මිනිස් ඇට සැකිල්ල එහි යනෙන කාට වුවද සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය භාවය පසක් කරවයි. යෝගාවචර භික්ෂූන් වහන්සේලා සිව් නමක් දැනට මෙම වන අරනේ ගල් ගුහා තුළ බවුන් වඩමින් සිටිති. ගල්දූවේ යෝගාශ්‍රම මූලස්ථානාධිපති පූජ්‍ය නාඋයනේ අරියධම්ම නා හිමියන්ගේ අනුශාසනා පරිදි ක්‍රියාත්මක වන මෙම කල්කිරියාගම හල්මිල්ලෑව චන්ද්‍රසාර ගුහාව වන සෙනසුනේ අධිපතිත්වය පූජ්‍ය බොරලන්දේ කල්‍යාණවංශ වනවාසී හිමියෝ උසුලති. මේ වනතුරුත් එළිපෙහෙලි වී නොමැති ඝන කැලෑව තුළ දිස්වන පැරණි ගොඩනැගිල්ලක් නටබුන් ලෙස සැලකිය හැකි ගල්කනු පංතිය අසල දැකිය හැකි පැරණි ගඩොල් බැමි සහිත වල නිදන් සොරුන් විසින් කනින ලද්දක් බවට එහි ගැමියෝ විශ්වාස කරති.



කඳු ගැටය පාමුල දක්නට ඇති කුඩා සංඝාවාසය.

සෙනසුනේ වැඩ වෙසෙමින් එහි වැඩිමනත් තතු සොයා බැලීම සඳහා ලෙන් සහිත කැලෑ ප්‍රදේශයේ සැරි සරමින් සිටි තලගුණේ ශාසනවංශ නමැති හිමිනමක් වල් අලියෙකුගේ පහර කෑමට ලක්වීමෙන් අපවත් වී ඇත්තේ මීට වසර කීපයකට ඉහතදීය. ශාසන මාමක අපිස් දිවි මඟකට උරුමකම් කියන මෙහි භික්ෂූන් වහන්සේලා පිඩු සිඟා වැඩීමේ කාර්යය සඳහා හිමිදිරියේම වන සෙනසුනෙන් පිටත්වෙති. එක් දිනකට එක් ගම්මානයක් වශයෙන් වෙන් කරගෙන ඇති උන්වහන්සේලා වන සතුන් ගහන කැලෑවේ අඩි පාරවල් මැදින් එකී ගම්මාන කරා වැඩම කොට පිඩු සිඟාගෙන ආපසු අරණට වැඩම කරන විට උදේ දහය කනිසම ඉකුත් වෙයි. පුංචිකුලම, ශාන්තගම, හිරිපිටියාගම, කලකිරියාගම, ගැමුණුපුර, හල්මිල්ලෑව ආදී දුෂ්කර ගම්මාන වල වැසියෝ, තම නිවෙස් කරා වැඩම කරන මෙම යෝගාවචර භික්ෂූන් වහන්සේලාට මහත් භක්තියෙන් දන් පිළිගන්වති. බුදු දහමේ හරය වටහාගෙන එහි නිවන් මග සෙවීමේ දුෂ්කර ගමනට අවතීර්ණ වී සිටින භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාට සිවුපසයෙන් සලකමින් පින් රැස්කර ගැනීමට බෞද්ධ ජනතාවට හැකි වනසේ කල්කිරියාගම "චන්ද්‍රසාර ගුහාව වන සෙනසුන" සංවර්ධනය කිරීමට එම දයක පින්වතුන් ගන්නා උත්සාහය දුර්ලභ ගණයේ මහා ශාසනික සේවාවක් ලෙස අපි දකිමු. මෙය බෞද්ධ ජනතාව දැක බලා ගත යුතු මෙන්ම - රැකබලා ගතයුතු පුදබිමක් වන අතරම මෙම වන සෙනසුන ආශ්‍රිත ප්‍රදේශය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණයට ලක්විය යුතු ස්ථානයක් ලෙසද සඳහන් කිරීම වටී.